ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2019 අගෝස්තු මස 20 දින |

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2019 ජූනි

### සමස්ත නිරීක්ෂණ

- වෙළඳ ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස පහළ යෑම සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර තුළින් ලද විදේශ විනිමය ලැබීම් සමඟ දළ නිල සංචිත වර්ධනය වීම හේතුවෙන් 2019 ජූනි මාසයේදී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය තවදුරටත් ශක්තිමත් විය.
- 2019 ජූනි මස දී වෙළඳ හිඟය, එ.ජ. ඩොලර් මිලියන 316 දක්වා අඩු වූ අතර එය 2010 ඔක්තෝබර් මාසයෙන් පසු වාර්තා වූ අවම අගය වේ.
- වෙළඳ හිඟයේ මෙම සැලකිය යුතු පහළ යෑම සඳහා ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 23.1 කින් අඩු වීම සහ අපනයන ඉපැයීම් පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 5.8 කින් ඉහළ යෑම හේතු විය.
- සංචාරක ඉපැයීම්, පාස්කු ඉරිදා ප්‍රහාරයේ බලපෑමෙන් පසුව ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වෙමින් 2019 වසරේ ජූනි මාසයේදී ඉහළ ගියේය. 2019 මැයි මාසයට සාපේක්ෂව සංචාරක ඉපැයීම් 2019 ජූනි මාසයේදී සියයට 66.8 කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2019 ජූනි මාසයේදී සංචාරක ඉපැයීම් පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 57.0 කින් අඩු විය.
- 2019 වසරේ ජූනි මාසයේදී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 537 ක් දක්වා සියයට 2.5 කින් ඉහළ ගියේය. සමුච්චිත පදනම මත, 2019 වසරේ පළමු භාගයේදී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 3,270 ක් ලෙස වාර්තා විය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් ‘මාසික වෙළඳ විවරණිකාව’ ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක. සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව https://www.cbsl.gov.lk/si/node/6181

- 2019 වසරේ ජූනි මාසය අවසානය වන විට ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු තුළින් වූ ලැබීම් සමඟ, දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 5.2 කට සමාන වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 8.9 ක් දක්වා ඉහළ ගියේය.

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරීත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2018 ජූනි එ.ජ.ඩො. මිලියන | 2019 ජූනි එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2018 ජන.- ජූනි එ.ජ.ඩො. මිලියන | 2019 ජන.- ජූනි එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 1,024 | 1,084 | 5.8 | 5,732 | 5,999 | 4.7 |
| ආනයන | 1,819 | 1,400 | -23.1 | 11,441 | 9,596 | -16.1 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -795 | -316 | | -5,709 | -3,597 | |
| සංචාරක ඉපැයීම් | 276 (ආ) | 118 (ඇ) | -57.0 | 2,186 (ආ) | 1,893 (ඇ) | -13.4 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 524 | 537 | 2.5 | 3,624 | 3,270 | -9.8 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | 0.3 | 10 | | 53 | -10 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 185 | 2,167 | | 3,874 | 5,526 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 48 | 49 | | 553 | 376 | |
| දිගුකාලීන ණය | 137 | 118 | | 821 | 750 | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | 2,000 | | 2,500 | 4,400 | |
| ජා.මූ. අරමුදල - විස්තීර්ණ ණය පහසුකම | 252 | - | | 252 | 164 | |
| විදේශ සෘජු ආයෝජන (ඉ) | | | | 336 | 262 | |
| සමස්ත ශේෂය | | | | 1,148 | 1,827 | |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2018 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය
(ඈ) ද්විතීයික සහ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ
(ඉ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස තුන සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළෙඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ

## වෙළඳ ශේෂය සහ වෙළඳ මිල අනුපාතය

- 2019 ජූනි මාසයේ දී වෙළඳ හිඟය, 2018 වසරේ අනුරූප මාසයට සාපේක්ෂව කැපී පෙනෙන ලෙස අඩු වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් මෝටර් රථ හා ඉන්ධන ආනයනය අඩු වීම හේතු විය. සමුච්චිත වශයෙන් සැලකූ විට, 2019 වසරේ පළමු මාස හය තුළදී වෙළඳ ගිණුමේ හිඟය 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 3,597 ක් දක්වා එ.ජ. ඩොලර් මිලියන 2,112 කින් අඩු විය.

- මේ අතර, අපනයන මිල ගණන්වලට සාපේක්ෂව ආනයනවල මිල නිරූපණය කරන වෙළඳ මිල අනුපාතය 2019 ජූනි මාසයේදී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව දර්ශකාංක 114.0 ක් දක්වා සියයට 3.6 කින් වර්ධනය වූ අතර, ඒ සඳහා සාමාන්‍ය වශයෙන් ආනයන මිල දර්ශකය පහළ යෑමේ වේගයට වඩා අඩු වේගයකින් අපනයන මිල දර්ශකය පහළ යෑම හේතු විය. කෙසේ වුවද, සමුච්චිත වශයෙන් සැලකීමේදී 2019 වසරේ පළමු මාස හය තුළ දී වෙළඳ මිල අනුපාතය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 1.5 කින් පිරිහීමට ලක් විය.

**රූප සටහන 1: මාසික වෙළඳ හිඟය (2018 – 2019)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: වෙළඳ මිල අනුපාතය (2018 – 2019)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරීත්වය

- 2019 ජූනි මාසයේදී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,084 ක් දක්වා සියයට 5.8 කින් අඛණ්ඩව 28 වැනි මාසයටත් ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන ඉහළ යෑම හේතු විය.
- ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා ඇඟලුම්, රබර් නිෂ්පාදිත සහ ප්‍රවාහන උපකරණ අපනයනවල ඉහළ ක්‍රියාකාරීත්වය හේතුවෙන් 2019 ජූනි මාසයේදී කාර්මික අපනයන ආදායම ඉහළ ගියේය. සාම්ප්‍රදායික වෙළඳපොළ මෙන්ම සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙතින් ඇඟලුම් සඳහා වූ ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් 2019 ජූනි මාසයේදී රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම සියයට 11.4 කින් ඉහළ ගියේය. ටයර් සහ ශල්‍ය හා වෙනත් අත්වැසුම් අපනයනවල ඉහළ ක්‍රියාකාරීත්වය හේතුවෙන් රබර් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගිය අතර, නාවික යාත්‍රාවක් ජපානයට සැපයීම පිළිබිඹු කරමින් ප්‍රවාහන උපකරණ අපනයන ආදායම සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ වුවද, 2018 ජූනි මාසයට සාපේක්ෂව 2019 ජූනි මාසයේදී ඛනිජතෙල් නිෂ්පාදිත සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම කැපී පෙනෙන ලෙස පහත වැටුණි.
- ප්‍රධාන වශයෙන් තේ, රබර්, කුළුබඩු සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායම අඩුවීම හේතුවෙන් 2019 ජූනි මාසයේදී කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව පහත වැටුණි. ප්‍රධාන වශයෙන් මිල ගණන් පහළ යෑම හේතුවෙන් 2019 ජූනි මාසයේදී

පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව තේ අපනයන ආදායම පහත වැටුණි. කෙසේ වුවද, 2019 ජූනි මාසයේදී පොල්, මුහුදු ආහාර සහ එළවළු අපනයන ආදායම ඉහළ ගියේය.

- 2019 ජූනි මාසයේදී ඛනිජ ද්‍රව්‍ය අපනයන ආදායම ද 2018 ජූනි මාසයට සාපේක්ෂව පහත වැටුණි.
- 2019 ජූනි මාසයේදී අපනයන පරිමා දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 6.4 කින් ඉහළ ගිය අතර, අපනයන මිල දර්ශකය සියයට 0.6 කින් පහත වැටුණි. එමගින් 2018 ජූනි මාසයට සාපේක්ෂව අපනයන වර්ධනය සඳහා අපනයන පරිමාව ඉහළ යෑම මුළුමනින්ම හේතු වූ බව පිළිබිඹු වේ.

**රූප සටහන 3: මාසික අපනයන ක්‍රියාකාරීත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 4: අපනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)

| කාණ්ඩය | 2018 ජූනි (එ.ජ. ඩොලර් මිලියන) | 2019 ජූනි (එ.ජ. ඩොලර් මිලියන ) | වෙනස (%) | 2018 ජන.- ජූනි (එ.ජ. ඩොලර් මිලියන) | 2019 ජන.- ජූනි (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **800.7** | **875.4** | **9.3** | **4,433.7** | **4,728.6** | **6.7** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 38.7 | 31.0 | (19.9) | 232.3 | 233.4 | 0.5 |
| සත්ත්ව ආහාර | 8.5 | 19.4 | 127.7 | 54.2 | 70.7 | 30.6 |
| රෙදිපිළි හා ඇඟලුම් | 453.5 | 505.3 | 11.4 | 2,519.0 | 2,761.4 | 9.6 |
| එයින් ඇඟලුම් | 419.4 | 472.3 | 12.6 | 2,350.8 | 2,570.8 | 9.4 |
| රෙදිපිළි | 25.7 | 23.4 | (9.1) | 120.6 | 138.0 | 14.4 |
| වෙනත් රෙදිපිළි සැකසුම් | 8.3 | 9.7 | 16.5 | 47.5 | 52.6 | 10.8 |
| රබර් නිෂ්පාදිත | 77.3 | 79.1 | 2.3 | 426.4 | 442.1 | 3.7 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 21.7 | 19.9 | (8.3) | 151.4 | 151.0 | (0.3) |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 45.0 | 34.4 | (23.6) | 219.9 | 206.5 | (6.1) |
| ප්‍රවාහන උපකරණ | 8.5 | 67.6 | 690.4 | 51.0 | 107.2 | 110.3 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 52.7 | 35.6 | (32.6) | 272.0 | 241.9 | (11.1) |
| රසායනික නිෂ්පාදිත | 15.2 | 15.5 | 1.8 | 81.8 | 87.9 | 7.5 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 12.4 | 10.8 | (13.4) | 70.4 | 70.7 | 0.5 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 3.8 | 1.9 | (49.5) | 10.2 | 23.3 | 128.8 |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 12.5 | 8.9 | (28.6) | 77.5 | 58.1 | (25.1) |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.7 | 6.0 | (11.1) | 38.6 | 36.3 | (5.8) |
| මූල ලෝහ හා උපාංග | 15.1 | 13.8 | (8.7) | 77.0 | 90.7 | 17.7 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 2.8 | 2.8 | (0.1) | 14.7 | 14.1 | (4.0) |
| වෙනත් | 26.1 | 23.5 | (9.9) | 137.3 | 133.1 | (3.0) |
| **2. කෘෂිකාර්මික අපනයන** | **219.4** | **204.5** | **(6.8)** | **1,272.3** | **1,245.1** | **(2.1)** |
| තේ | 129.6 | 113.2 | (12.7) | 728.9 | 684.9 | (6.0) |
| රබර් | 2.2 | 1.7 | (23.5) | 18.7 | 15.0 | (20.0) |
| පොල් | 25.0 | 29.3 | 17.1 | 150.1 | 173.2 | 15.4 |
| කුළුබඩු | 27.7 | 24.5 | (11.6) | 149.7 | 143.6 | (4.1) |
| එළවළු | 1.8 | 2.3 | 30.1 | 12.6 | 16.0 | 27.0 |
| සකස් නොකළ දුම්කොළ | 3.5 | 3.5 | 0.7 | 16.8 | 16.6 | (1.4) |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 10.6 | 8.6 | (19.5) | 62.1 | 52.3 | (15.9) |
| මුහුදු ආහාර | 18.9 | 21.4 | 13.1 | 133.4 | 143.6 | 7.6 |
| **3. ඛනිජ අපනයන** | **3.2** | **2.8** | **(9.9)** | **16.7** | **16.7** | **0.3** |
| **4. වර්ග නොකළ අපනයන** | **1.1** | **1.2** | **12.1** | **9.2** | **8.8** | **(4.2)** |
| **මුළු අපනයන** | **1,024.4** | **1,084.0** | **5.8** | **5,731.9** | **5,999.2** | **4.7** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ අනෙකුත් ඛනිජතෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරීත්වය

- 2019 ජූනි මාසයේදී අඛණ්ඩව අටවැනි මාසයටත් පහත වැටුණු ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,400ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 23.1 ක පහළ යෑමක් වාර්තා කළේය. 2019 ජූනි මාසයේදී ආනයන පහළ යෑම සඳහා පාරිභෝගික භාණ්ඩ, ආයෝජන භාණ්ඩ සහ අන්තර් භාණ්ඩ යන ප්‍රධාන කාණ්ඩ තුනම දායක විය.
- විශේෂයෙන් පෞද්ගලික භාවිතය සඳහා ගනු ලබන රථවාහන ඇතුළු සියලුම ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ යටතේ වර්ග කර ඇති කාණ්ඩවල ආනයන පහළ යෑම හේතුවෙන් 2019 ජූනි මාසයේදී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සියයට 39.4 කින් පහත වැටුණි. පෞද්ගලික භාවිතය සඳහා ගනු ලබන රථවාහන ආනයනය අඛණ්ඩව අඩු වීම, දෙමුහුන් හා විද්‍යුත් රථවාහන සහ සිලින්ඩර ධාරිතාව 1000 ට අඩු රථවාහන ආනයන මත 2019 මාර්තු මාසයේදී නිෂ්පාදන බදු ඉහළ දැමීමේ බලපෑම පිළිබිඹු කරයි. මුහුදු ආහාර, ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත හැර ආහාර හා පාන වර්ග යටතේ වර්ග කර ඇති සියලුම උප කාණ්ඩවල ආනයන අඩු වීම පිළිබිඹු කරමින් ආහාර හා පාන වර්ග ආනයන වියදම ද පහත වැටුණි.
- ප්‍රධාන වශයෙන් ඉන්ධන ආනයනය අඩු වීම හේතුවෙන් 2019 ජූනි මාසයේදී අන්තර් භාණ්ඩ ආනයන වියදම සියයට 11.1 කින් පහත වැටුණි. ආනයන පරිමාව හා මිල ගණන් යන සාධක ද්විත්වයේම පහළ යෑම හේතුවෙන් බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජතෙල් ආනයනය පහත වැටුණි. අන්තර් භාණ්ඩ ආනයනය අඩු වීම සඳහා රෙදිපිළි හා රෙදිපිළි උපාංග, පොහොර, රසායනික නිෂ්පාදිත, ආහාර සැකසුම් සහ කඩදාසි හා ඝන කඩදාසි ආනයන අඩු වීම ද දායක විය. කෙසේ වුවද, 2019 ජූනි මාසයේදී මූලලෝහ ආනයනය ඉහළ ගියේය.
- සියලුම උප කාණ්ඩවල ආනයන පහළ යෑම හේතුවෙන් 2019 ජූනි මාසයේදී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි. ප්‍රධාන වශයෙන් යකඩ හා වානේ සහ සිමෙන්ති ආනයන අඩු වීම හේතුවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය පහළ ගිය අතර, වාණිජ කටයුතු සඳහා භාවිත කරන කැබ් රථ සහ ත්‍රිරෝද රථ වැනි රථ වාහන ආනයනය පහළ යෑම හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයන වියදම පහත වැටුණි.
- 2019 ජූනි මාසයේදී ආනයන පරිමා දර්ශකය සියයට 19.8 කින් පහළ ගිය අතර, ආනයන මිල දර්ශකය සියයට 4.0 කින් පහත වැටුණි. මෙමගින් 2018 ජූනි මාසයට සාපේක්ෂව 2019 ජූනි මාසයේදී ආනයන වියදම පහළ යෑම සඳහා ආනයන පරිමාව මෙන්ම මිල පහළ යෑම ද හේතු වූ බව පිළිබිඹු වේ.

**රූප සටහන 5: මාසික ආනයන ක්‍රියාකාරීත්වය**




මූලය: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 6: ආනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | 2018 ජූනි (එ.ජ. ඩොලර් මිලියන) | 2019 ජූනි (එ.ජ. ඩොලර් මිලියන ) | වෙනස (%) | 2018 ජන.-ජූනි (එ.ජ. ඩොලර් මිලියන) | 2019 ජන.-ජූනි (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **425.9** | **258.1** | **(39.4)** | **2,620.7** | **1,811.0** | **(30.9)** |
| ආහාර හා පාන වර්ග | 125.8 | 97.7 | (22.4) | 907.1 | 689.9 | (23.9) |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.9 | 2.1 | 10.6 | 109.7 | 16.3 | (85.1) |
| එයින් සහල් | 0.5 | 0.5 | 0.6 | 100.1 | 5.9 | (94.1) |
| කිරි නිෂ්පාදිත | 28.8 | 17.5 | (39.4) | 166.7 | 151.6 | (9.1) |
| එළවළු | 28.3 | 23.3 | (17.9) | 170.0 | 141.3 | (16.9) |
| පාන වර්ග | 9.7 | 5.6 | (42.5) | 43.0 | 41.5 | (3.6) |
| කුළුබඩු | 8.2 | 5.9 | (27.3) | 51.9 | 50.1 | (3.5) |
| මුහුදු ආහාර | 10.6 | 15.1 | 41.9 | 104.6 | 107.3 | 2.5 |
| සීනි හා රසකැවිලි | 22.6 | 19.3 | (14.6) | 152.9 | 104.3 | (31.7) |
| වෙනත් ආහාර හා පාන වර්ග | 15.6 | 8.9 | (43.0) | 108.2 | 77.5 | (28.4) |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 300.1 | 160.5 | (46.5) | 1,713.7 | 1,121.1 | (34.6) |
| පෞද්ගලික රථවාහන | 146.8 | 48.1 | (67.2) | 812.7 | 324.2 | (60.1) |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 48.3 | 38.4 | (20.5) | 258.8 | 249.2 | (3.7) |
| විදුලි සංදේශ මෙවලම් | 24.8 | 14.3 | (42.4) | 141.4 | 115.1 | (18.6) |
| ගෘහ උපකරණ | 18.3 | 12.2 | (33.2) | 120.0 | 97.6 | (18.7) |
| රෙදිපිළි හා උපාංග | 24.6 | 18.3 | (25.5) | 165.1 | 134.2 | (18.7) |
| ගෘහ හා දැව භාණ්ඩ | 13.4 | 12.2 | (8.8) | 84.1 | 75.3 | (10.5) |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 23.9 | 16.9 | (29.4) | 131.6 | 125.6 | (4.6) |
| **2. අන්තර් භාණ්ඩ** | **947.4** | **842.6** | **(11.1)** | **6,319.9** | **5,546.4** | **(12.2)** |
| ඉන්ධන | 342.7 | 284.5 | (17.0) | 2,093.6 | 2,001.0 | (4.4) |
| එයින් බොරතෙල් | 111.8 | 92.5 | (17.2) | 431.3 | 491.3 | 13.9 |
| පිරිපහදු කළ ඛනිජ තෙල් | 228.1 | 192.0 | (15.8) | 1,515.2 | 1,384.5 | (8.6) |
| ගල් අඟුරු | 2.8 | 0.0 | (99.2) | 147.1 | 125.2 | (14.9) |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 8.5 | 6.9 | (18.9) | 495.2 | 88.1 | (82.2) |
| එයින් රත්‍රන් | 0.4 | 0.1 | (72.9) | 437.8 | 1.6 | (99.6) |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 230.9 | 226.6 | (1.9) | 1,360.5 | 1,394.8 | 2.5 |
| රසායනික නිෂ්පාදිත | 72.0 | 61.4 | (14.8) | 446.0 | 411.5 | (7.7) |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 52.8 | 45.5 | (13.9) | 353.0 | 289.9 | (17.9) |
| රථවාහන හා යන්ත්‍රසූත්‍ර කොටස් | 22.9 | 18.6 | (18.8) | 152.0 | 133.8 | (12.0) |
| කඩදාසි හා ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 45.1 | 31.6 | (30.0) | 250.4 | 211.3 | (15.6) |
| මූල ලෝහ | 43.4 | 60.8 | 40.3 | 289.1 | 277.5 | (4.0) |
| තිරිඟු හා ඉරිඟු | 18.1 | 32.7 | 80.7 | 193.0 | 143.4 | (25.7) |
| පොහොර | 20.6 | 8.2 | (60.4) | 121.2 | 93.4 | (22.9) |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 22.8 | 16.3 | (28.6) | 126.5 | 108.8 | (14.0) |
| ආහාර සැකසුම් | 26.8 | 12.4 | (53.9) | 162.3 | 116.9 | (27.9) |
| වෙනත් අන්තර් භාණ්ඩ | 40.7 | 37.1 | (8.8) | 277.2 | 276.0 | (0.4) |
| **3. ආයෝජන භාණ්ඩ** | **443.5** | **299.0** | **(32.6)** | **2,432.4** | **2,235.6** | **(8.1)** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 195.6 | 176.8 | (9.6) | 1,263.9 | 1,232.4 | (2.5) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 117.2 | 98.6 | (15.8) | 759.2 | 725.5 | (4.4) |
| ප්‍රවාහන උපකරණ | 130.4 | 23.3 | (82.1) | 406.0 | 274.5 | (32.4) |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.3 | 0.3 | 3.1 | 3.3 | 3.2 | (3.0) |
| **4. වර්ග නොකළ ආනයන** | **2.7** | **0.1** | **(94.6)** | **68.0** | **3.0** | **(95.6)** |
| **මුළු ආනයන** | **1,819.5** | **1,399.8** | **(23.1)** | **11,441.1** | **9,596.0** | **(16.1)** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

- පාස්කු ඉරිදා ප්‍රහාරයේ බලපෑමෙන් පසුව 2019 ජූනි මාසයේදී සංචාරක පැමිණීම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් විය. ඒ අනුව, 2019 වසරේ මැයි මස වාර්තා වූ සංචාරක පැමිණීම් සංඛ්‍යාව 37,802 ට සාපේක්ෂව 2019 ජූනි මස සංචාරක පැමිණීම් සංඛ්‍යාව 63,072 ක් දක්වා සියයට 66.8 කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2019 වසරේ ජූනි මාසයේ සංචාරක පැමිණීම් සංඛ්‍යාව පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 57.0 කින් පහත වැටුණි. මෙම අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු ඉන්දියාව, චීනය, එක්සත් රාජධානිය සහ ඕස්ට්‍රේලියාව වැනි ප්‍රධාන රටවල්වලින් පැමිණෙන සංචාරකයින් ගණන අඩු වීමයි. ඉන්දියාව සහ චීනය යන රටවල සංචාරකයින්ගේ පැමිණීම අඩු වීම, මුළු අඩුවීමෙන් සියයට 41.6 කට දායක විය.
- 2018 ජූනි මාසයේදී වාර්තා වූ සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 276 ට සාපේක්ෂව 2019 ජූනි මාසයේදී සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 118 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. සමුච්චිත පදනම මත, 2018 වසරේ පළමු මාස හය තුළදී සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 2,186 ට සාපේක්ෂව මෙම වසරේ එම අනුරූප කාලය තුළදී එ.ජ. ඩොලර් මිලියන 1,893 ක් ඇස්තමේන්තු කර ඇත.
- මේ අතර, 2019 ජූනි මාසයේදී, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පෙර වසරේ අනුරූප කාලයට සාපේක්ෂව සියයට 2.5 කින් එ.ජ. ඩොලර් මිලියන 537 ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, සමුච්චිත පදනම මත, 2019 වසරේ පළමු භාගය සඳහා විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 3,270 ක් දක්වා සියයට 9.8 කින් පහත වැටුණි.

**රූප සටහන 7: සංචාරක පැමිණීම්හි ප්‍රධාන මූලාශ්‍ර (ජූනි)**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 8: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී වාණිජ බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූල්‍ය ලැබීම්

- 2019 වසරේ ජූනි මාසයේදී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 5 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. සමුච්චිත පදනම මත, වසරේ පළමු භාගය තුළදී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් වූ ශුද්ධ ගෙවීම් එ.ජ. ඩොලර් මිලියන 96 ක් විය.
- ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළුව කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන, 2019 වසරේ ජූනි මාසයේදී එ.ජ. ඩොලර් මිලියන 10 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. සමුච්චිත පදනම මත, 2019 වසරේ පළමු භාගය තුළදී ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළුව කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 10 ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය.
- තවද, 2019 ජූනි මාසයේදී රජය වෙත වූ දිගුකාලීන ණය, එ.ජ. ඩොලර් මිලියන 99 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.

## ජාත්‍යන්තර සංචිත

- 2019 ජූනි මාසය තුළදී නිකුත් කරන ලද එ.ජ. ඩොලර් බිලියන 2 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු තුළින් වූ ලැබීම්ද සමඟ රටෙහි දළ නිල සංචිත, 2019 මැයි මස අවසන් වන විට වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 6.7 සිට 2019 ජූනි මස අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 8.9 දක්වා ඉහළ ගොස් ඇත (එම සංචිත මට්ටම ආනයනික මාස 5.2 කට සමාන විය). මේ අතර, දළ නිල සංචිත හා බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත මුළු විදේශීය වත්කම් ප්‍රමාණය, 2019 ජූනි මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 11.5 ක් වූ අතර, එය ආනයනික මාස 6.8 කට සමාන විය.

**රූප සටහන 9: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

- 2019 වසරේ අගෝස්තු මස 20 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 3.0 කින් අතිප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල, ජපන් යෙන් හැර අනෙකුත් සියලු ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ද අතිප්‍රමාණය විය.

**රූප සටහන 10: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2018 | 2019 (අගෝ. 20 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|
| එ.ජ. ඩොලරය | -16.4% | +3.0% |
| යුරෝ | -12.7% | +6.3% |
| ස්ටර්ලින් පවුම | -11.4% | +7.7% |
| ජපන් යෙන් | -18.1% | -0.6% |
| කැනේඩියානු ඩොලරය | -9.3% | +0.7% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -7.6% | +7.2% |
| ඉන්දියානු රුපියල | -8.7% | +5.3% |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව